www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මහ බැංකු ප්‍රධානියා දැඩි කප්පාදු සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලයි

## US Fed chief demands austerity plan

**බැරී ශ්‍රේ විසිනි**
**2010 අප්‍රේල් 15**

ඔබාමා හා කොන්ග්‍රස් පාලන තන්ත්‍රය අහස උසට නඟින අයවැය හිඟය පියවා ගැනීම සඳහා දැඩි කප්පාදු පියවර ඇතුලත් වැඩ සටහනක් ඉක්මනින්ම සකසා ගත යුතුව ඇතැයි. මහ බැංකු සභාපති බෙන් බර්නන්කේ කොංග්‍රසයේ ඒකාබද්ධ ආර්ථික කමිටුව හමුවේ කරුනු දක්වමින් කියා සිටියේය.

සිය ආරම්භක කරුනු දැක්වීම, මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳ කොටසෙන් අවසන් කල ඔහු, දැඩි කප්පාදු ප්‍රතිපත්ති සඳහා සිය ඉල්ලීම අවධාරනය කලේය. "ජනතාවගේ හා මුදල් වෙලඳපලවල විශ්වාසය රඳවා ගැනීම පිනිස දැරිය හැකි මූල්‍ය තුලනයේ පරාවක්‍රයක ෆෙඩරල් අයවැය පිහිටුවා ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් තීරනාත්මක ලෙස ක්‍රියාකිරීම අවශ්‍ය බව" ඔහු කියා සිටියේය.

ෆෙඩරල් හිඟය හා රාජ්‍ය නය පාලනය සඳහා සැලසුමකට එකඟ වීම තුලින්, කෙටි කාලීන හා දිගු කාලීන වාසි අත්වනු ඇතැයි අවධාරනය කල ඔහු, එමඟින් දිගු කාලයේදී පහත් පොලී අනුපාතිකයන් පවත්වා ගැනීමට ක්ෂනික දිරිගැන්වීමක් සැපයෙනු ඇතැයි කියා සිටියේය.

එවන් දැඩි කප්පාදු වැඩ සටහනකට අඩංගු විය යුත්තේ කුමක් ද යන්න ඕනෑකමින්ම මඟහල බර්නන්කේ, "ඒ සඳහා දුෂ්කර තෝරාගැනීම් අවශ්‍ය වනු ඇතැයි" පැවසීය. එය, සමාජ වැඩසටහන්වල ප්‍රබල කප්පාදුවක් පිලිබඳව වහෙන් ඔරෝ භාෂාවෙන් කථා කිරීමකි.

පසුගිය සතියේ ඩලාස්හි පැවැත්වූ දේශනයක දී බර්නන්කේ, එක්සත් ජනපද ජනගහනය වයස්ගත වීමේ මූල්‍යමය ගම්‍යයන් පිලිබඳව අනතුරු ඇඟවීය. එමඟින් ඔහු ප්‍රබල ලෙස ඇඟවුම් කලේ, සමාජ සුරැකුම් හා වෛද්‍ය රක්ෂන වැනි වයස්ගත වූවන් වෙනුවෙන් ඇති හිමිකම් වැඩ සටහන් ගැඹුරින්ම කපා හැරීමට ඔහු දක්වන කැමැත්තයි.

මෙය ඔබාමා පාලනාධිකාරයේ ප්‍රතිපත්ති වලට අනුකූලය. සමාජ සුරැකුම්, වෛද්‍ය රක්ෂන හා වෛද්‍ය සහන සඳහා දරන වියදම් අඩුකිරීම ද විභවාත්මක බදු වැඩිකිරීම් ද නිර්දේශ කිරීම සඳහා ඔබාමා පාලනය හිඟ පිලිබඳ ද්විපාර්ශවික කොමිසමක් පිහිටුවා තිබේ.

රිපබ්ලිකන් සෙනේට් සභික සෑම් බ්‍රවුන්බැක් සමඟ අදහස් හුවමාරුවක දී අරපිරිමැස්ම වෙනුවෙන් සිය ඉල්ලීම බර්නන්කේ විසින් යලි අවධාරනය කලේය. ආන්ඩුවේ නයගැතිකම හා හිඟ අයවැය, ආයෝජකයන්ගේ විශ්වාසයට යටින් වල කපා, එක්සත් ජනපද නය ගැනීමේ පිරිවැය ඉහල දැමීමේ හැකියාව ගැන අනතුරු ඇඟවූ ඔහු කියා සිටියේ, "දිගුකාලීන දරාගැනීමේ හැකියාව මුදුන්පත්කර ගැනීමට නම්, ඇත්ත වශයෙන්ම අපගේ ආර්ථික හැකියාව පිලිබඳව නොව, අපගේ දේශපාලන හැකියාව, දේශපාලන අධිෂ්ඨානය පිලිබඳව කිසියම් අවස්ථාවක දී වෙලඳපොලවල් විශ්වාසය තැබීමට පටන් ගනු ඇත. ඒ අවස්ථාවේ දී පොලී අනුපාතික ඉහල නැඟිය හැක...."

එය දැන් සිදුවිය හැකිදැයි බ්‍රවුන්බැක් විමසූ විට බර්නන්කේගේ පිලිතුර වූයේ, "සත්තකින්ම, එය පූර්න වශයෙන්ම සිදුවිය හැක්කක්" බවය. "අපගේ දේශපාලන ක්‍රමය මූල්‍ය ප්‍රතිපත්ති අතින් තිරසාර පරාවක්‍රයක පිහිටා කටයුතු කරනු ඇති බවට මහත් විශ්වාසයක් සලකුනු කරන" වත්මන් වෙලඳපොලවල් පිලිබඳව ඩිමොක්‍රටික් සෙනේට් සභික ඒමි ක්ලෝබුකර් හට බර්නන්කේ පසුව කියා සිටියේය. එහෙත් ඔහු තව දුරටත් කියා සිටියේ, "අප එසේ නොකරන්නේ නම් හෝ එසේ කිරීමේ හැකියාවක් අප සතු නොවන්නේ යයි ප්‍රබල ලෙස අඟවුම් කරන්නේ නම්, එය 2040 වසරේදී අප තුල කනස්සල්ල දනවන කාරනයක් නොව හෙට දිනයේ අප කනස්සල්ලට පත්කරන්නක් වනු ඇති" බවය.

මහ බැංකුවේ ව්‍යවහාරික භාෂාවෙන් සරල ඉංග්‍රීසියට පරිවර්තනය කල හොත්, එහි අර්ථය, ලක්ෂ සිය ගනනකගේ ජීවන තත්වයන්ට බරපතල පල විපාක ගෙන දෙන ජනතාව කිසිසේත් ප්‍රිය නොකරනු ඇති කප්පාදුවලට දේශපාලන සංස්ථාපිතය එකඟවිය යුතුය යන්නයි.

2012 මූල්‍ය වර්ෂය අවසානයේදී සියයට 70 දක්වා වැඩිවනු ඇතැයි දැනට ප්‍රක්ෂේපනය කර තිබෙන

දල දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය නය අනුපාතය, 2020 වන විට සියයට සියය ඉක්මවනු ඇතැයි බර්නන්කේ අනතුරු ඇඟවීය. ජාතික නයේ පිපිරෙන සුලු වර්ධනයට මුඛ්‍ය හේතුව, බැංකු වලට ඇප දීම සඳහා ඩොලර් ට්‍රිලියන ගනනින් මුදල් යෙදවීම බව කියා සිටීමෙන් ඔහු වැලකුනේය.

එක්සත් ජනපදය "මධ්‍යස්ථ" ආර්ථික ප්‍රතිප්‍රාප්තියක් අත්විඳිමින් සිටින බව ඔහු පැවසීය. එහෙත්, තවත් දිග කාල පරිච්ඡේදයක් තුල විරැකියාව බෙහෙවින් ඉහල මට්ටමක පවතිනු ඇතැයි ඔහු ඇඟවුම් කලේය. "පසුගිය වසර දෙක තුල අහිමිවූ මිලියන 8.5 රැකියා ආපසු ලබා දීමට සැලකිය යුතු කාලයක් ගතවනු ඇතැයි" ඔහු කියා සිටියේය.

බැංකුවල ලාභ ඉහල යමින් පැවති අතර, නිවැසියන්ට හා ව්‍යාපාරිකයන්ට ඒවායේ නය සම්පාදනය පහත වැටෙමින් තිබෙන බව ඔහු සඳහන් කලේය.

චීනයට එරෙහිව වෙලඳ යුද්ධයේ පියවර ගැනීම වෙනුවෙන් උද්ඝෝෂනයේ යෙදී සිටින ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රමුඛ සෙනේට් සභිකයෙකු වන චාල්ස් ෂුමර් විසින් නැගූ ප්‍රශ්නයකට පිලිතුරු වශයෙන් බර්නන්කේ, බීජිං පාලන තන්ත්‍රයේ ව්‍යවහාර මුදල් ප්‍රතිපත්තිය පිලිබඳව මෙතෙක් කරන ලද වඩාත්ම ඍජු විවේචනය ඉදිරිපත් කලේය. "චීන ව්‍යවහාර මුදල අඩු අගයක පවත්වා ගන්නා බවටත්, නිර්යාතවලට වඩාත් නැඹුරුවූ ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීමට එය යොදාගෙන තිබෙන බවටත් බොහොමයක් ආර්ථශාස්ත්‍රඥයින් එකඟවන බව" ඔහු ෂුමර්ට පැවසීය. "සිය විනිමය අනුපාතිකයට, වඩා නම්‍යශීලී බවක් ගෙනදීමෙන් චීන ජාතිකයින්ට යහපත් තත්වයක් උදාවනු ඇතැයි සිතමි" යනුවෙන් ද ඔහු පැවසීය.

© www.wsws.org